# Proceedings of International Conference on Intangible Cultural Heritage

## Fostering Folklore Research

*"Enriching Global Citizens through Traditional Insights"*

ICICH 2019



26th September 2019

Department of Anthropology
Faculty of Humanities and Social Sciences
University of Sri Jayewardenepura

CamScanner

# ශ්‍රී ලංකාවේ බලි ශාන්තිකර්මයේ සෞන්දර්යාත්මක පැතිකඩ

එල්. එන්. ඒ. ඩී. පී. නිශ්ශංක

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය

*darshana.nissanka@gmail.com*

සියවස් ගණනාවක් පුරා හෙළ ජනයා තම නීරෝගී භාවය සහ සෞභාග්‍යය ළඟා කරගැනීම සඳහා විවිධ වූ සිරිත් විරිත් සහ විවිධ වූ ක්‍රමෝපායයන් අනුගමනය කිරීමට හුරු වී සිටියහ. ඔවුන ට ඇතිවන ලෙඩ දුක්, විවිධ අතුරු ආන්තරා වන් මෙන්ම අමනුෂ්‍යය බලපෑම් වලින් මිදීම පිණිස දෙවියන් යැදීම, වැඳීම සහ පිදීම සිදු කළහ. ඔවුන්ගේ ප්‍රධානතම ගැලැවුම් කරුවා වූයේ දෙවියන් හෝ යක්ෂයින්ය. එමෙන්ම නව ග්‍රහයින්ගෙන් ඇතිවන්නා වූ අපල දුරු කරගැනීමටත් වැඳුම් පිදුම් සිදු කළහ. මෙම සියලු කාරණා හේතුකොටගෙන එකල මනුෂ්‍යයා ගස්, ගල්, ගිනි, මුහුදු, පොළොව, ඉර, හඳ ආදී වූ භෞතික වස්තූන්ට ද දේවත්වයක් ආරෝපණය කොට තම ගතේත් සිතේත් සැනසීම වෙනුවෙන් පූජා පැවැත්වූ හ. අතීත හෙළ ජනයා වදනින්, ගායනයෙන්, භේරී වාදනයෙන්, වැඳ වැටීමෙන්, ඇඹීමෙන්, ඇඳීමෙන් සහ යැදීමෙන් දෙවියන් පිදිය හැකි යයි විශ්වාස කළහ. බලි ශාන්තිකර්මය වනාහි දෙවියන්, යකුන්, ග්‍රහයින් පිදීමෙහි ලා මිනිසා විසින් නිර්මාණය කොටගත්තා වූ විචිත්‍ර වූ ශාන්තිකර්මයක් වන අතරම එය ශ්‍රී ලාංකේය සංස්කෘතිකාංගයන් හි ප්‍රමුඛ ස්ථානයක් ගන්නා අංගයකි. මෙම පර්යේෂණයෙහි මූලික අරමුණ වනුයේ ශ්‍රී ලංකාවේ පවතින සාම්ප්‍රදායික බලි ශාන්තිකර්මයන් හි සෞන්දර්යාත්මක පසුබිම පිළිබඳ අධ්‍යයනය කිරීමයි. ප්‍රාථමික මූලාශ්‍ර, ද්විතීයික මූලාශ්‍ර, සාකච්ඡා ක්‍රමය සහ ප්‍රත්‍යක්ෂ අධ්‍යයනයන්ද දත්ත රැස්කිරීම සඳහා උපයෝගී කරගන්නා ලදී. බලි ශාන්තියේ උපත භාරතයේ සිදු වුව ද එහි සෞන්දර්යාත්මක අගයන් වර්ධනය වූයේ ලක්දිවදී ය. උඩරට, පහතරට සහ සබරගමු යනුවෙන් ප්‍රධාන සම්ප්‍රදායයන් ත්‍රිත්වයක්ද නුවර කළාවියේ බලි සහ ඌව බලි වශයෙන් ද ලක්දිව බලි විකාශනය සිදුවිය. බලි ශාන්තිකර්මය යනු ගායනය, වාදනය, නර්තනය, ඇඹුම් ශිල්පය සහ චිත්‍ර ශිල්පය යනාදී සකල කලාවන්ගෙන්ම පරිපූර්ණ වූ සංස්කෘතිකාංගයකි. බලි ශාන්තිකර්මය මුලුමනින්ම ගායනාවන්ගෙන් සමන්විතය. ස්තෝත්‍ර, සන්න, සැහැළි සහ අෂ්ටක ආදියෙන් පරිපූර්ණ වූ එය මනා වූ නාද මාලාවන්ගෙන් ගායනා කෙරේ. මෙම ගායනාවන් බලි ශාන්තිකර්ම සම්ප්‍රදායයෙන් සම්ප්‍රදායයට විවිධ ස්වරූපයෙන් වේ. එමෙන්ම වාද්‍ය භාණ්ඩද සම්ප්‍රදායයෙන් සම්ප්‍රදායයට විවිධ වේ. උඩරට සම්ප්‍රදායයෙහි ගැටබෙරය මෙන්ම උඩැක්කියද, පහතරට සම්ප්‍රදායයෙහි දෙවොල් බෙරය මෙන්ම සබරගමු සම්ප්‍රදායයෙහි දවුල ද වාද්‍ය භාණ්ඩ ලෙස භාවිතා කෙරේ. එමෙන්ම වාග් විලාසයත්, නර්තන වින්‍යාසයත්, බලි ඇඹීමේ කලාවත් සම්ප්‍රදායයෙන් සම්ප්‍රදායයට වෙනස් වූ ස්වරූප ගනියි.

***ප්‍රමුඛ පද:*** *බලි ශාන්තිකර්ම, නව ග්‍රහයින්, හෙළ ජනයා, සංස්කෘතිය*



CamScanner